# ප්‍රජාතන්ත්‍රවාදය සහ පාලන ක්‍රමය

## සංක්ෂිප්ත සටහන

"රාත්‍රියේ අපේ කාමරයේ සිටි එකිනෙක කතාබහේ යෙදුණා. අපි කතා කළේ අපට රස්සාවක් තිබිලා අපට සල්ලි උපයන්න පුළුවන් වුනා නම් කියල. අපි අපේ පවුල්වල අය වෙනුවෙන්, අපේ සැමියන් වෙනුවෙන් හුඟක් කැප කිරීම් කළා. ඒත් අපි තවම කිසිම
දියුණුවක් ලබලා නෑ. අපිට නිදහසක් නෑ. ඉදිරි අවුරුදු මීට වඩා හොඳ වෙයි කියලා අපි හිතනවා.

2014 ජාතික සාම කවුන්සිලය විසින් පවත්වන ලද සුහද සංචාරයන්ට සහභාගී වූ තරුණ කාන්තාවක් අප්‍රේල් මාසයේ සිට ජාතික සාම කවුන්සිලය විසින් කාන්තා හා සංවර්ධන සංසදයෙහි ආධාර සහිතව පශ්චාත් යුද උපසමනය යටතේ කාන්තා ප්‍රතිපත්ති ප්‍රකාශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මෙමඟින් ශ්‍රී ලංකා රජය විසින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයෙහි 1325 යෝජනාවේ දිරිගැන්වීම මත ආරම්භ කරන ලද සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමයට සහාය දැක්වීමත්, කාන්තාවන්ට සුරක්ෂිත පරිසරයක් ගොඩනැඟීමත් ඔවුන්ගේ සමාජීය හා දේශපාලනික සහභාගීත්වය වර්ධනය කිරීමත් අරමුණුගත ඉලක්ක විය.

මෙම ව්‍යාපෘතිය හරහා සමාජයේ කොන්වීමට ලක් වූ සමාජයේ පහළම ස්ථරවල වෙසෙන කාන්තාවන් හා ඍජුවම සහසම්බන්ධ වී කටයුතු කිරීමට ජාතික සාම කවුන්සිලයට අවස්ථාව හිමිවිය. මෙහි දී අපගේ ක්‍රියාකාරකම්හි ඉලක්කය වූයේ ඒකී කාන්තාවන්ගේ හඬට ඉඩකඩක් නිර්මාණය කරදීමත් ඒ සඳහා පුළුල් පුද්ගල හා ප්‍රජා සාකල්‍ය ක්‍රියාදාමයක් සකස් කිරීම හා ජාතික උපසමනය හරහා ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වයන් සඳහා ඔවුන්ට අවස්ථාව උදාකර දීමත් ය. යුද්ධය නිසා පීඩාවටපත් වවුනියාව, මන්නාරම්, ත්‍රිකුණාමලය, අම්පාර, ගාල්ල, හම්බන්තොට, මහනුවර, නුවරඑළිය, පුත්තලම යන දිස්ත්‍රික්ක නවයෙහි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. විවිධ සංවිධාන, ආගමික නායකයින් හා රජයේ නිලධාරීන්ගේ සහභාගීත්වයත් සමඟ යුද්ධයේ බලපෑමට ලක් වූ 900ක් පමණ ජනතාව සමඟ කටයුතු කිරීමට සිදුවිය. 300කට අධික කොන්කිරීමට ලක් වූ විශේෂයෙන් ම වැන්දඹුවන් හා පශ්චාත් යුධ ක්‍රියාදාමය තුළ විවිධ ගැටලුවලට මුහුණ දුන් ගෘහණියන් අතරින් කාන්තාවන් 72 දෙනෙක් මෙම ව්‍යාපෘතියේ නායිකාවන් ලෙස පත් කරනු ලැබුණි. මෙම කාන්තාවෝ තම තමන්ගේ දිස්ත්‍රික්කවල පවතින කටයුතු සම්බන්ධීකරණය කළහ. ඔවුන් විසින් සාමූහික ක්‍රියාකාරකම්, ප්‍රතිසාධන ක්‍රියාකාරකම් ඇරඹීම, විරෝධතාවයන් සංවිධානය කිරීම, ප්‍රාදේශීය ප්‍රතිසංස්කරණ, උපදේශන සේවාවන් මෙන් ම ශ්‍රී ලංකාවේ යුක්තිය, සමානාත්මතාව හා ප්‍රතිසංධානය සුරක්ෂිත කිරීම සඳහා ගෙන ඇති උත්සාහයන් පිළිබඳව අධ්‍යාපනය ලබාදීම සිදුකර ඇත. මෙම සාරාංශ සටහන හරහා ඉස්මතු කරන්නේ ගැටුම්වලට මුහුණ දුන් කාන්තාවන්ගේ අත්දැකීම් සහ වදහිංසා, අයුක්තිය, අසමානාත්මතාවය, සිත් වේදනාවන් හා නොසලකාහැරීම් සඳහා සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය හරහා සාර්ථක ප්‍රවේශයක් ගෙන තිබේ ද යන්න හා ව්‍යාපෘතිය හරහා සිදුකරනු ලබන නිර්දේශයනුත් ය.

මෙම සටහන හරහා ලංකාවේ කාන්තාවන් ගොදුරු වී සිටින මානසික යථාභාවය සඳහා බාධා වන අප්‍රසන්න සිදුවීම් පිළිබඳව සාකච්ඡා කෙරේ.

We wish to thank Resources for Peace and Reconciliation, Mannar; SHAKTHI Organisation, Trincomalee; True Vision Rural Rehabilitation Organisation, Ampara; Women Organisation for Development, Equity, Peace and Temperance, Puttalam; Cultural and Environmental Society, Nuwara Eliya; Ruhunu Rural Women's Organisation, Hambantota; Women's Chamber of Commerce, Kandy; Human Resources and Community Development Foundation, Galle; and Rural Women's Forum, Vavuniya.







ක්‍රමවේදය

මෙම ක්‍රමවේදයේ හරය වන්නේ දැනුවත් කිරීමේ
සිට ක්‍රියාත්මකවීම දක්වාත්, උපසමනය කිරීමේ
සිට බලගැන්වීම දක්වාත් අඛණ්ඩ වර්ධනය සඳහා
සහාය ලබාදීමයි. ජාතික සාම කවුන්සිලය විසින්
ව්‍යාපෘතියට අදාළ දිස්ත්‍රික්කයන් නියෝජනය
කරන අපගේ ප්‍රාදේශීය සහයකයින්ගේ උපකාර
සහිතව පහත ක්‍රියාවලින් දියත් කර ඇත.

01. සංක්‍රාන්තික යුක්තිය සඳහා දිස්ත්‍රික්ක
මට්ටමින් ස්ත්‍රී පුරුෂ මානයන් දිශානුගත කිරීම.
යෝජිත සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණය පිළිබඳ
කාන්තාවන්ට හා ප්‍රජා නායකයින්ට අධ්‍යාප-
නය ලබාදීමත් ජනතාව අතර සාමය හා යුක්තිය
සඳහා පවතින බාධාවන් පිළිබඳ සමාජයේ පහළ
ස්ථරවල සිටින කාන්තාවන් සමඟ සිදුකරන
සාකච්ඡාවනුත්, ඔහීකෲ 1325 හා යෝජිත යා-
න්ත්‍රණය හරහා සලකාබලන දිස්ත්‍රික්කයන්හි
වෙසෙන්නන්ගේ දුක්ගැනවිලි සහ ප්‍රමුඛ අවශ්‍යතා
සහයෝගීව හඳුනාගැනීමත් මේ හරහා සිදුවිය.

02. උපසමන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම
සඳහා කාන්තා රැස්වීම.
සෑම දිස්ත්‍රික්කයකම ස්වකීය ප්‍රජාව තුළින් ම
දරුණු ලෙස නොසලකාහැරීමට හා කොන්කිරීමට
ලක් වූ කාන්තාවන් සමඟ සාකච්ඡා කිරීම හා
කුටුම්භයන්, ප්‍රජාවන් හා ජාතික උපසමනය
ශක්තිමත් කිරීම සඳහා මුල පිරීමට සැලසුම්
කෙරිණි.

03. ප්‍රතිසාධන ක්‍රියාවලීන්
මෙමඟින් සෑම දිස්ත්‍රික්කයකම කාන්තාවන්ගේ
දුක්ගැනවිලි සඳහා ආමන්ත්‍රණය කිරීමක්
ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ උපදේශනයක්
සමාජීය හා දේශපාලනික කරුණු සඳහා
සම්බන්ධවීම ඉහළ නැංවීම සඳහා සිවිල් සමාජය,
ප්‍රාදේශීය පාලන ආයතන හා ආගමික නායක-
යන්ගේත් ප්‍රජා නායකයන්ගේත් සහාය සහිතව
නායකත්වය සැපයීම සිදුවුණි.

04. සුහද සංචාරයන්
කතාන්දර හුවමාරුව ගැටුම් සමයෙහි උගත්
පාඩම් පිළිබඳ අත්දැකීම් බෙදාගැනීමත් ගැටුම්
නිසා බෙදුණු ප්‍රජා කණ්ඩායම් අතර අවබො-
ධය ශක්තිමත් කිරීමත් ප්‍රතිසංස්කරණය සඳහා
සාමූහික සහභාගීත්වය වර්ධනය වීම යනාදිය ඒ ඒ
දිස්ත්‍රික්කයන්හි කාන්තාවන් අතර සිදුවන අන්තර්
කලාපීය සංචාරයන් හේතුවෙන් බලගැන්විණි.

මෙම ක්‍රියාකාරකම් හරහා යුද්ධය නිමා වී
දශකයකට ආසන්න කාලයක් ගත වුවද
තවදුරටත් නිහඬව දෛනික පීඩාවට පත්ව සිටින
කාන්තාවන්ට තම අදහස් හෙළිදරව් කිරීමට පුළුල්
ඉඩකඩක් නිර්මාණය කර තිබුණි. මෙම
කාන්තාවන් තෝරාගනු ලැබුවේ ඔවුන්ගේ
පුද්ගලික අත්දැකීම්, සාමය සඳහා එල්ල
වූ අභියෝගයන් බලහත්කාරයට හා
තම ආදරණීයයන් අතුරුදහන්වීමට ලක්-
වූවත්, රාජ්‍ය සේවයට ප්‍රවේශවීම සීමාවීමට ලක්-
වූවත් සහ වාර්ගිකත්වය, ආගම, භාෂාව පදනම්
කරගෙන සිදුකරන ලද ප්‍රතික්ෂේප කිරීම් සහ
දිගින් දිගටම සිදුවන අනේකවිධ අයිතීන් උල්ලං-
ඝණය වීම ද, උග්‍ර දිළිඳු බව, කළුකඩ වෙළඳාම,
ලිංග භේදය පදනම් කරගත් හිංසනයන්, ළමා
අපචාර, ගෘහණියන්ට හා වැන්දඹුවන්ට එරෙහිව
සිදුවන අඩන්තේට්ටම යනාදිය පදනම් කරගෙනය.
මෙම ව්‍යාපෘතිය තුළ තෝරාගත් දිස්ත්‍රික්ක 9 කින්
ලද කරුණු පමණක් අඩංගු වන අතර, තවදුරටත්
පශ්චාත් යුද සමය තුළ කාන්තාවන් මුහුණදුන්
අභියෝග හා අත්දැකීම් පිළිබඳ වැදගත් කරුණු
සාකච්ඡා කරමින් ජාතික සංක්‍රාන්තික යුක්ති ක්‍රිය-
ාදාමය තුළ කාන්තාවන්ගේ ඉල්ලීම් නියෝජනය
කිරීම පිළිබඳවත් විස්තර කරයි.



Hambantota; Women's Chamber of Commerce, Kandy;
Human Resources and Community Development Foun-
dation, Galle; and Rural Women's Forum, Vavuniya.

ප්‍රජාතන්ත්‍රවාදය සහ යහ පාලනය

දශක තුනක් මුළුල්ලේ පැවති සිවිල් යුද්ධයත්, වසර කිහිපයක් පැවති ඒකාධිපති පාලනයත් ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රියාදාමය දුර්වල කිරීමට සමත් විය. අධිකරණ පද්ධතියෙහි ප්‍රතිසංස්කරණ, මානව අයිතිවාසිකම් ශක්තිමත් කිරීම, රාජ්‍ය ආයතන ප්‍රතිසංවිධානය සහ ප්‍රජාතන්ත්‍රවාදී ජීවිතයක් සඳහා ජනතාවට ඇති සමාන අයිතිය සුරක්ෂිත කිරීම යනාදිය අඛණ්ඩ ක්‍රියාදාමයක් වන සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය සඳහා වැදගත් වේ. ව්‍යාපෘතිය සඳහා යොදාගත් පහළ සමාජ ස්ථරවල වෙසෙන ජනතාවගේ ආකල්පයන්, අපේක්ෂාවන්, හුරුපුරුදුකම් සහ ඔවුන් මුහුණ පා ඇති අභියෝගයන් ආදිය විමසා බැලීම මඟින් ප්‍රජාතන්ත්‍රවාදය නැවත ස්ථාපිත කිරීමේ මුල් අවධිය තුළ සමාජයේ නොසලකාහැරීමට නැතහොත් කොන් කිරීමට ලක් වූ කාන්තාවන්ගේ සමාජීය කාර්යභාරය විදහා දක්වයි.

පුරවැසි ජීවිත ශක්තිමත් කිරීම

සාමය ජන ජීවිතය සමඟ මුසුවීම පිළිබඳව කාන්තාවන් සමඟ සාකච්ඡා කිරීමේ දී ඔවුන් යුද්ධයෙන් පසුව ඇතිවුණ සාමකාමී පරිසරය දැඩි ලෙස අගය කරති. යාම් ඊමේ නිදහස, ඉහළ මට්ටමේ ආරක්ෂාව, නීතියේ ආධිපත්‍යය තහවුරු වෙමින් පැවතීම, බියජනක වටපිටාව සහ කලබලකාරිත්වයන් ඉවත්ව යාම පුරවැසියන් සමනය ජීවන තත්ත්වයන් හි නියැලීම වර්ධනයවීමට හේතු විය. සමස්තයක් වශයෙන් සියලු දෙනා ප්‍රකාශ කළේ රාජ්‍ය ආයතනයන් පෙර පැවති තත්ත්වයට සාපේක්ෂව වඩා විනීත සහ වගකීම් සහගත අයුරින් ක්‍රියා කරන බවත්, ඒ හරහා තම අයිතීන් ලබාගැනීමටත් හැකි වාතාවරණයක් පවතින බව ය. නව පාලන තන්ත්‍රයක් විසින් දේශපාලනික මෙන්ම ව්‍යුහාත්මක වෙනස්කම් කිරීමට යොමු වුවහොත් වර්තමාන රජය විසින් ක්‍රියාත්මක කරන සාධනීය ක්‍රියාවලීන් ඉදිරියටත් එලෙසම පවත්වාගෙන යන්නේ ද යන්න සුළු ජන ප්‍රජාවන්ට ගැටලුකාරී බව ප්‍රකාශ විය.



"මුලින්, අපි හමුදාවට බයෙන් හිටියේ. නමුත්, දැන් අපට කොළඹ ගිහින් අපේ අතුරුදහන් වුණු ඥාතීන් ගැන හොයලා බලන්න පුළුවන්. සීඅයිඩී එක අපි කියන දේවල් පිළිගන්නවා. ඔවුන් පවා ඇතැම් වෙලාවට අපි වෙනුවෙන් ක්‍රියාමාර්ග ගත්තේ නැති, අපිව ප්‍රතික්ෂේප කරපු නිලධාරීන්ට දොස් නඟනවා."

- මන්නාරම ප්‍රදේශයේ දමිළ කාන්තාවක් -

කෙසේ වුවත්, තවදුරටත් බොහෝ අභියෝගයන් ශේෂව පවතී. ව්‍යුහාත්මක වශයෙන් පවතින දේශපාලනික අඩුලුහුඬුකම් (13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසි ලෙස ක්‍රියාත්මකර කිරීම වැනි), ප්‍රජාතාන්ත්‍රික යාන්ත්‍රණයන් පලුදු කිරීම (අධිකරණය, පොලිස් සහ ප්‍රාදේශීය නිලධාරීන්ගේ පෙළගැස්වීම්) ප්‍රචණ්ඩත්වයේ සහ යුද්ධයේ අත්දැකීම් තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදය සඳහා යන ගමනට පවතින බාධාවන් ලෙස හඳුනාගත හැක. එමෙන්ම, රාජ්‍ය පාලනයටත් සංවර්ධනයන්ටත් ජනතාවට ඍජුව සහභාගිවීමට ඇති නිදහස පුළුල් වී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා දායක වූ ජනතාවට පවතින ප්‍රමුඛ ප්‍රශ්නය වූයේ දැරිය නොහැකි ජීවන වියදමයි. ආහාර, විදුලිය, අධ්‍යාපනය වැනි මූලික අවශ්‍යතාවන් වෙනුවෙන් වැය කිරීමට සිදුව ඇති දැරිය නොහැකි අධික වියදම ඔවුන්ට තම පවුල් නඩත්තු කිරීම සඳහා දෛනිකව විශාල ජීවන අරගලයක නිරතවීමට හේතු පාදක වී ඇත. විශේෂයෙන් ම පවුලේ ගෘහමූලිකත්වය දැරීමට සිදුව ඇති





කාන්තාවන්ට ද, පහළ හෝ මධ්‍යම පාන්තික
භේදයකින් තොරව තම පවුල් නඩත්තු කිරීම
සඳහා වෙහෙසීමට සිදුව ඇත.
බොහෝවිට සෑම පවුලක් ම පාහේ එක
පුද්ගලයෙකුගේ ඉපැයීම් මත පමණක් රඳා
පැවතීම මත එකිනෙකාගේ අන්‍යොන්‍ය
අවශ්‍යතාවන් ක්ෂණිකව සපුරාගත නොහැකි
තත්ත්වයක් හඳුනාගත හැකිය.

**"එක අයෙක්ට ප්‍රශ්නයක් ඇති වුණාමඑයාට
ඒක තනියම විසඳගන්න විදිහක් නෑ. මේ නිසා
මිනිස්සුන්ට පොදු සමාජ ප්‍රශ්න ගැන හිතන්න
කලින් තමන්ගේ පුද්ගලික ප්‍රශ්න විසඳගන්න
මහන්සි වෙන්න වෙනවා."
- මහනුවරින් සහභාගි වූවෙක් -**

අපගේ නිරීක්ෂණයන්ට අනුව පැහැදිලි වූ
වැදගත් කරුණක් වූයේ ව්‍යාපෘතියට සහභාගි වූ
දිස්ත්‍රික්ක අතරින් අම්පාර සහ නුවරඑළිය යන
දිස්ත්‍රික්කයන් හි පවතින උග්‍ර දිළිඳුබවට හේතු
වී ඇත්තේ ඔවුන් ප්‍රජා ක්‍රියාකාරිත්වයේ පවතින
අවම ස්වභාවය බවයි. ඔවුන් පවසන අන්දමට
ඔවුන්ගේ ප්‍රාථමික ජීවනෝපායයන් ඔවුන්ගේ
දෛනික පැවැත්ව තහවුරු කිරීමට පමණක්
සමත් වේ. තම රඳා පැවැත්මට එල්ලවී ඇති
අභියෝගයන්ට හේතු වී ඇති පුළුල් සමාජීය
හා දේශපාලනික හේතූන් විවේචනය කිරීමට
ඔවුහු අපොහොසත් වූහ. කණ්ඩායමේ සිටි
තරුණ ප්‍රජාවගේ පවා නිර්මාණශීලීත්වය,
ධනාත්මක සිතුවිලි හා ධෛර්යවත්බව සිඳීගෙ
ාස් ඇති සෙයක් දක්නට ලැබුණි. උනන්දු කළ
විටදී පවා කාන්තාවන් වෙතින් සමාජය පිළිබඳ
වෙනස් නවමු දැක්මක් ඇති කරවීම දැඩි අපහසු
මට්ටමක පැවතුණු අතර, එය සමාජීය වෙනස-
ක් සඳහා යන ගමනේ දී ඔවුන්ගේ හැකියාවන්
අවහිර කරන්නක් සේ දිස් විය.

යුද්ධය තුළ ඔවුන් අත්විඳි වේදනාවන්,
නොසලකා හැරීම් සහ කොන් කිරීමට ලකම්ම
යන හේතු තවදුරටත් ඔවුන්ව පොදු කටයුතුවලි-
න් ඈත්කර තැබීමට මුල් වී ඇත. ඉටු නොවූ
බහුතර ජාතියට පක්ෂ වූ නීතිය ද, සුළු ඡන්ද
කොට්ඨාසයන් තුළ ආණ්ඩුව කෙරෙහි සාධාරණ
අවිස්වාසයක් ජනිත කරවීමටත් ප්‍රජාතන්ත්‍රවාදී
සහභාගිත්වයක් සඳහා තමන්ට ඇති ඉඩකඩ
පිළිබඳ සැකයකුත් මතුකර ගැනීමට හේතු විය.
මන්නාරම, වවුනියාව, සහ ත්‍රිකුණාමලය
දිස්ත්‍රික්කයන් නියෝජනය කළ කාන්තාව-
න් පවසන අන්දමට නීතිය ඉටු කරගැනීම
සඳහා යොමුවීමේ දී ඔවුන්ට අත්විඳීමට සිදුව
ඇත්තේ රජයෙන් නියම කළ පටිපාටියට වෙනස්
තත්ත්වයකි. කේන්තිය, බිය, බලාපොරොත්තු
සුන්වීම, වේදනාව වැනි සුළු ජන පිරිස් වෙලාගෙන
ඇති හුරුපුරුදු තවදුරටත් මිලිටරි පාලනයක් තුළ
ජීවත්වීමට සිදුවීම හා
දේශපාලනික ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා වී
ජීවත්වීමට සිදුවීම වැනි කම්කටොළු හේතුවෙන් සුළු
ජනවර්ග තුළ තවදුරටත් නොනැසී පැවතීමට හේතු
වී ඇත. මෙම තත්ත්වය එළදායී වඩා ශක්තිමත්
රාජ්‍ය පාලනයක් සඳහා සුළු ජනවර්ග සහ රජය
අතර පවතින විශ්වසනීය සම්බන්ධතාව බිඳ දැමීමට
සමත් වේ. කෙසේ වුවද, අපගේ සැලකිල්ලට
ලක් වූ කරුණක් වූයේ යුද්ධය පැවති ප්‍රදේශවල
සිටි දමිළ කාන්තාවන් තමන්ට යුක්තිය ඉටුකරවා
ගැනීම සඳහා අසාමාන්‍ය අන්දමේ දැඩි පරිශ්‍රමයක
නියැලෙන බවයි. මිලිටරි පාලනයෙන් එල්ලවන
බලපෑම් යටතේ ජීවත්වන දමිළ ජනතාව
ප්‍රතිසංස්කරණයන් මෙන්ම අතුරුදන්වූවන් නැවත
සොයාගැනීම සඳහා කටයුතු කිරීම අත්‍යවශ්‍ය
වේ. යුක්තිය ලබාගැනීම වෙනුවෙන් කටයුතු
කිරීම මෙන්ම තම ඉල්ලීම් දිනාගැනීම සඳහා ඔවුන්
සතු වූ සාමුහික අත්දැකීම්වල උපකාරයෙන් මෙම
ප්‍රදේශවල පොලිසිය, අධිකරණය හා ග්‍රාමසේවක
නිලධාරීන් සමඟ කටයුතු කරන ආකාරය
කාන්තාවන් විසින් විස්තර කරන ලදී. දමිළ
කාන්තාවන්ගේ පුරවැසිභාවය සහ ඔවුන්ගේ
ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනැගීම සඳහා ඔවුන්ගේ
සහභාගිත්වය කෙරෙහි ඔවුන් මුහුණදුන්
දේශපාලනික කොන්කිරීම් සහ නොතකා හැරීම්
බලපෑ අන්දම ඔවුන්ගේ අත්දැකීම් ඇසුරෙන් ප්‍රකාශ
විය.

ව්‍යාපෘතිය තුළදී අපට විද්‍යමාන වූ කරුණක් වූයේ
පවතින බිඳවැටීම් සහ අභියෝගයන් නොතකා
පුරවැසි ජීවිතය නැවත නගාසිටුවීම නැතහොත්
ප්‍රතිසාධනය කිරීමේ වැදගත් කාර්ය මගින් ශ්‍රී
ලාංකික ජනතාව තුළ පවතින සමාජ සේවා
අගයයන් ශක්තිමත් වන බවයි. සියලුම දිස්ත්‍රික්ක
නියෝජනය කළ කාන්තාවෝ නවමු සමාජයීයට
වෙනසක් සඳහා ජනතාව මෙහෙයවීමට හා
උපදේශනය කිරීමට ස්වෙච්ඡාවෙන් ම ඉදිරිපත්වීමට
කැමැත්ත පළ කළහ. ඒ අනුව, මන්නාරම
නියෝජනය කළ කාන්තාවෝ ඔවුන් ම එකතුව
අතුරුදන්වූවන් පිළිබඳ ලේඛනයක් පිළියෙළ කිරීමට
සැලසුම් කළහ; වවුනියාවේ කාන්තාවන් රජය විසි-
න් අතුරුදන්වූවන්ගේ පවුල්වලට දුන් පොරොන්දු
ඉටුකරවා ගැනීමට බලකිරීම සඳහා විරෝධතාවන්
සංවිධානය කළහ; හම්බන්තොට කාන්තාවන් තම
ප්‍රදේශවල පාසල් සඳහා දෙමළ භාෂාව උගන්වන
ගුරුවරුන් සංඛ්‍යාව ඉහළ දමාගැනීම සඳහා ප්‍රා-

දේශීය පාලන නියෝජිතයන් සමඟ පවත්වන සාකච්ඡාවන් පිළිබඳ සැලසුම් කළහ; මහනුවර පිරිස සිංහල හා දමිළ දෙපිරිසට ම ඉගැන්වීම සඳහා ස්වෙච්ඡාවෙන් ම ඉදිරිපත් වුණි. ඒ අනුව, සෑම දිස්ත්‍රික්කයක් සඳහා ම බාහිර පුද්ගලයෝ පවා ඔවුන්ගේ පුද්ගලික ගැටලු මධ්‍යයේ වුවද සහභාගි වී මෙම ක්‍රියාකාරකම් සඳහා සහය ලබාදුන් හ. මෙය ජනතාවට මඟපෙන්වීම හා හෘදයාංගමවීම හරහා අතීතයෙන් වර්තමානයට පැමිණීමටත් යළි නැගී සිටීම සඳහත් හැකිවීම, සමාජය වර්ධනය කිරීමේ හැකියාව පුරවැසියා සතු ය යන ප්‍රජාතන්ත්‍රවාදයේ න්‍යායික මතය යළි තහවුරු කිරීම වැනි ය.

**"සෑම පුද්ගලයෙක් ම පොදුවේ මෙන්ම පෞද්ගලිකව ද යහපත් සමාජයක් ගොඩනැගීම සඳහා දායක විය යුතු ය. ඔවුන් පොදු ජනතාවගේ යහපත් සමාජයීය ක්‍රියාකාරකම් සංවිධානය කළ යුතු ය."**
**- ගාල්ල ප්‍රදේශයෙන් සහභාගිවූවෙක් -**

**අපි තනිව වෙනසක් කිරීමට උත්සහ කරනවාට වඩා පිරිසක් එකතු වී කරන විට ශක්තිමත් වැඩියි. අපි සුභාවදී සමාජයීය වෙනසක් කරන විට අපට දැනෙනවා එය සමාජයේ සුවතාවය නැතහොත් උපසමනය සඳහා ද හේතු වන බව."**
**- මහනුවර උපසමන ක්‍රියාකාරකම තුළ දී හමුවුනු ප්‍රකාශයක් -**

පුරවැසි අයිතීන් සඳහා ප්‍රවේශ වී ව්‍යාපෘතිය අතරතුර අපට හමු වූ බොහෝ කාන්තාවන් පැවසුවේ ඔවුන්ට පුරවැසි අයිතීන් සඳහා ප්‍රවේශවීමට ආයතනික හා ක්‍රමවේදමය බාධාවන් පවතින බවයි. මන්දගාමී සහ අවම බලපෑම් සහිත යුක්තිය ඉටුවීම් (නීතියට අනුව වැරදිකරුවන්ට දඬුවම් ලබාදීමට අසමත්වීම, නඩු ඉවතලෑම, සමාදානයට එකඟවීම); රාජ්‍ය ආයතනවල සිදුවන ඥාති සංග්‍රහය සහ දූෂණ ක්‍රියාවලීන් (පොලිස් සේවයේ පක්ෂග්‍රාහිත්වය, සේවා සඳහා අල්ලස් ලබාගැනීම, සංවර්ධන කාර්යයන් සඳහා ඇති මුදල් අවභාවිත කිරීම, සමෘද්ධි බෙදාහැරීමේ දී හා ඉඩම් සඳහා ආධාර රාජ්‍ය නිලධාරීන් විසින් සිදුකරන දූෂිත ක්‍රියාවන්); අතුරුදන්වූවන් සෙවීම සඳහා ඇති මන්දගාමී වැඩපිළිවෙළ; ලේඛනයන්ගේ හිඟකම (ප්‍රධාන වශයෙන් ම වැවිලි අංශයේ) රාජ්‍ය සේවයේ පවතින අවම මට්ටමේ ගුණාත්මකභාවය (සුදුසුකම් වෙනුවට ඥාති සංග්‍රහය මත සිදු වූ බඳවාගැනීම් හා පුහුණුව නෙ-ාමැතිකම් හා අවම මට්ටමේ දැනුවත්භාවය හේතුවෙනි) වැනි හේතූන් සමාජයේ පහළ ස්ථරවල වෙසෙන ජනතාවට රජය පිළිබඳව පවතින ප්‍රතිරූපය ගොඩනැගීමට පොලිසිය, අධිකරණ සේවය සහ ප්‍රදේශීය නිලධාරීන්ගේ ඇසුර මත ලද අත්දැකීම් හේතුවිය. මේ තත්ත්වයට බලපෑම් කිරීම සඳහා රාජ්‍ය හස්තයන්ගේ මැදිහත්වීම් සහ සකසන ලද නවමු නියාමනයන් සහ ආයතනික ප්‍රතිසංස්කරණයන් අවශ්‍ය වේ. පුරවැසි භාවය ශක්තිමත් කිරීම සඳහා බලතල බෙදාහැරීම ක්‍රියාත්මක කිරීමක් සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය තුළ ආයතනික ප්‍රතිසංස්කරණයන් සිදුකිරීමත් වැදගත් පියවර ලෙස දැක්විය හැක. එමෙන්ම ජනතාවට කාර්යක්ෂම, පිරිසිදු හා ජනතා අවශ්‍යතාවලට සංවේදී අයුරින් සම්පත් මෙහෙයවන සේවයක් ලබාදීමට ප්‍රදේශීය රාජ්‍ය නියෝජිතයින් කටයුතු කළ යුතු ය.

**"යුක්තිය ලබාගැනීමට නැගී සිටීමට විශාල ධෛර්යයක් අවශ්‍යයි. කාන්තාවක් වුණත් මම එක සැරයක් ග්‍රාමසේවකට විරුද්ධව නැගී සිටියා. ඒ, ඔහු නිවාස අරමුදල් නිකුත් කිරීමට රුපියල් 1,000ක මුදලක් අයකිරීමට පටන්ගැනීම නිසයි. එහි ප්‍රතිඵලයක් විදිහට මම හැමෝගෙන් ම තනි වුණා. හැමෝම මාව කරදරකාරියක් විදිහට සැලකුවා. ග්‍රාමසේවක එයාගේ බලපුළුවන්කාරකම් යොදලා මාව මෙල්ල කළා. මෑතක් වෙනකම් ඔහු මගේ නිවසට විදුලිය ලබාගැනීම සඳහා ඉල්ලුම් කළ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කළා."**
**- වව්නියාවේ දමිළ කාන්තාවක් -**

**"සමහර වෙලාවට අපට හිතෙනවා අපේ ප්‍රශ්න පොලිසියට අරන් නොගිහින් අපි ම විසඳගන්න එක හොඳයි කියලා. අපට අනතුරුදායක හැඟීමක් දැනෙනවා අපි පොලිසියට ගියාම. හවස 6න් පස්සෙ පොලිසියට ගියොත් එහෙ කාන්තා පොලිස් නිලධාරිනියෝ නෑ. රෝහලට ගියත් එහෙමයි. කාන්තාවන්ට වෙන අසාධාරණයන් නවත්වන්න රජය වැඩපිළිවෙලක් ගන්නවානම් හොඳයි කියලා අපි හිතනවා."**
- ගාල්ලේ පැවති කාන්තා රැස්වීමක දී ප්‍රකාශ කරන ලද්දක් -

මෙම ව්‍යාපෘතිය තුළ දී අපට හැඟී ගිය තවත් කරුණක් වූයේ ආයතනික දුර්වලතාවන්ට අමතරව තොරතුරු ලබාදීමේ පවතින මන්දගාමී සහ අවම ස්වභාවය ද ප්‍රජාතාන්ත්‍රික යාන්ත්‍රණය දුර්වල කරන බවයි. වැදගත් ජාතික ක්‍රියාවලියක් වන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන් සහ ජාතික සාමය ගොඩනැගීම සඳහා රජය විසින් ඉතා අවම මට්ට-



මේ ජනතා සහභාගිත්වයක් ලබාගෙන ඇති බව සනාථ විය. මෙම ක්‍රියාවලීන් පිළිබඳ වන සාකච්ඡ- ාවන් දැඩි නිහඬබවින් යුතු වන බව කාන්තාවෙ- ා් ප්‍රකාශ කළහ. ඔවුන් පැවසූ ආකාරයට සත්‍ය සෙවීමේ කොමිසම පිළිබඳව ඔවුහු කිසිවක් නෙ- ාදැන සිටියහ. පුරුෂාධිපති නායකත්වයකින් යුත් දේශපාලන ක්‍රමයක් හරහා රජය නිලධාරීන් තමන්ෙ- ග්
අවශ්‍යතාවන් සහ ආශාවන් මැනවින් අවබෝධ කරගනීවි යැයි හෝ අතීතය පිළිබඳව වටහා ගනීවි යැයි හෝ ඔවුන් තුළ විශ්වාසයක් නැත. සිංහල, දෙමළ, මුස්ලිම් යන සියලු ජන ප්‍රජාවන් සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය සඳහා පොදු ඉඩකඩක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව දැඩිව පෙන්වා දෙන ලදී. සත්‍ය සෙවීමේ කොමිසමේ ප්‍රතිසංස්කරණයන් මාධ්‍ය හරහා ජනතාවට දැනුම්දීම, මහජන රැස්වීම් පැවැත්වීම, රාජ්‍ය නියෝජිතයින්ට සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය සඳහා පුහුණු කිරීම යනාදිය මඟින් ලංකාවේ තිරසාර සංවර්ධනය සඳහා ඉහළ අන්දමේ සුභවාදී ජනතා සහභාගිත්වයක් අපේක්ෂා කළ හැකිය. මහජන කටයුතු සම්බන්ධයෙන් පවතින

නියමයන් හි හිඟකමට අමතරව, අත්‍යවශ්‍ය වැදගත් කරුණු දැනගැනීමට ඇති ඉඩකඩ ද අවම ය. වර්තමානයේ බොහෙ- ා්විට සිවිල් සමාජය හෝ සමාජ ජාලයන් හරහා තොරතුරු දැනගැනීමට සිදුවී ඇති අතර, රාජ්‍ය ආයතන වෙතින් ඉතා අපහසුවෙන් තොරතුරු ලබාගැනීමට සිදුවන අතර, බොහෝ විට අණපනත් හා චක්‍රලේඛ සිංහල භාෂාවෙන් පමණක් නිකුත් කිරීම හේතුවෙන් දෙමළ භාෂාව කථා කරන ජනතාව දැඩි අපහසුතාවකට මුහුණ දේ. කාන්තාවන්ගේ ප්‍රමුඛ ඉල්ලීමක් වන්නේ තමන්ගේ යුතු බවයි. හදිසි අවශ්‍යතාවන් ඉටු කරගැනීම සඳහා රජයේ නිලධාරීන් වෙතින් වඩා ප්‍රායෝගික තොරතුරු ලබාදීම සිදුකළ යුතු

බවයි. එමගින් ඔවුන්ගේ අයිතිවාසිකම් ලබාගැනීම පහසුවන ආකාරයක් ඔවුන්ට හැඟේ. විශේෂයෙන් ම අහිමි වුණු ඉඩම් නැවත ලබාග ැනීමටත්, ලියකියවිලි ලබාගැනීමටත්, නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත්, අතුරුදන්වූවන් සොයාග ැනීමට කටයුතු කිරීමත් සඳහා මෙන්ම සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමයේ අංගයන් වන සත්‍ය හෙළිදරවු කරගැනීමටත්, හානිපූරණය කරගැනීමටත් පහසු වේ.

බිම් මට්ටමේ ක්‍රියාකාරකමක් ලෙස සැලකිය හැකි භාෂා අයිතිය ක්‍රියාත්මක කිරීම රජය විසි- න් පුරවැසි ක්‍රියාකාරකම් කෙරෙහි මැදිහත්වීම හා දිරිගැන්වීමත්, සහයෝගය දැක්වීමත් විදහා පාන්නක් ලෙස සැලකිය හැකිය. සියලු රජයේ ලේඛනයන්, මහජන දැන්වීම් හා ප්‍රදර්ශන පුවරු ආදිය දෙමළ භාෂාවෙන් ද දැක්වීමත්, ජාතික ගීය දෙමළ භාෂාවෙන් ගායනා කිරීමට ඉඩදීමත් යන- ාදිය දෙමළ සුළු ජන ප්‍රජාව සඳහා, පවතින රජය විසින් අරඹන ලද සාර්ථක වැඩපිළිවෙලවල් ලෙස දැක්විය හැකිය. රජය විසින් ජනතා සහභාගිත්වය සහිතව භාෂා අයිතිය පුළුල් කිරීම සඳහා වැඩි ඉඩප්‍රස්ථාවක් ලබාදී





ඇත. අපගේ ව්‍යාපෘතියෙහි දී හඳුනාගත හැකි වූ අතිශය වැදගත් කරුණක් ලෙස භාෂා අයිතිය සෑම දිස්ත්‍රික්කයක ම නියෝජිතයින් විසින් සහතික කරන ලද්දකි. තමන්ගේ භාෂා අයිතිවාසිකම උල්ලංඝනය වීම හා ඒ ඔස්සේ තමන්ගේ ප්‍රදේශ තුළ දී මුහුණදීමට සිදු වූ අසාධාරණ හා අයුක්ති සහගත අත්දැකීම් පිළිබඳව කාන්තාවන්ට ඉහළ මට්ටමේ අවබෝධයක් පැවතිණ. උදාහරණයක් ලෙස, අම්පාර
ප්‍රදේශයේ පොලිසිය වරක් ඔවුන්ට පවසා තිබුණේ සිංහල නොදන්නේ නම්, ඉවත් ව යන ලෙසයි. මහනුවර ප්‍රදේශයේ සිංහල කාන්තාවෝ චක්‍රලේඛ සහ අණපනත් දෙමළ භාෂාවෙන් ද ප්‍රකාශයට පත්කිරීම අනිවාර්ය දෙයක් ලෙස ප්‍රකාශ කළහ. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කාන්තාවෝ දෙමළ භාෂාව හැසිරවිය හැකි රෝහල් සේවකයන්ගේ හිඟය හේතුවෙන් රෝහල්වලදී මුහුණපාන්නට සිදුවන අපහසුතාවන් පිළිබඳව පැවසූහ.

**"දෙමළ භාෂා බාධකය නිසා ගැබිණි කාන්තාවන් කිහිපදෙනෙකු ම සූතිකාගාර තුළ දී සහ රෝහල් තුළ දී මිය ගියා. ඔවුන් නොදන්නා භාෂාවෙන් නඟන ලද ප්‍රශ්නවලට නිසි ලෙස පිළිතුරුදීමට නොහැකි වූ විට රෝහල් සේවකයින්ගෙන් රෝගීන්ට දරුණු වාග් ප්‍රහාරමය බැණවැදීම්වලට මුහුණදීමට සිදුවෙනවා."**
**- අම්පාරේ මුස්ලිම් කාන්තාවක් -**

භාෂා අයිතිය සඳහා නවමු රාමුවක් ගොඩනැංවීම වාර්ගික පීඩාවක් අභිබවා යාමක් වන බැවින් රජය විසින් ජාතීන් අතර පවතින බෙදීම අවමකර, ඔවුන් අතර පවතින අවකාශයන් දුරලමින් අතීත බිඳවැටීම් පසෙක ලා එකට එක් ව නැගී සිටීමට උපකාරීවන ක්‍රියාදාමයක් ලෙස යොදාගන්නා සෙයක් දැකගත හැක. මහනුවර, ගාල්ල, හම්බන්තොට දිස්ත්‍රික්කවල සිංහල, මුස්ලිම් සහ දෙමළ යන ත්‍රිවිධ ජනවර්ගයන් ම භාෂාමය විවිධත්වය ඇති අංශ සඳහා එකට එක් ව ක්‍රියා කරති. ඔවුන් තම ප්‍රදේශවල



තමන්ගේ භාෂාවන් ඉගැන්වීමට කටයුතු කරන අතර, පාසැල්වල දමිළ භාෂාව ඉගැන්වීම වර්ධනය කිරීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙල ප්‍රාදේශීය මට්ටමෙන් සංවිධානය කිරීමත්, ප්‍රාදේශීය රාජ්‍ය සේවකයින්ගේ භාෂා ඥානය වර්ධනය සඳහා කටයුතු කිරීම වැනි ක්‍රියාමාර්ගයන් ඉහත වැඩපිළිවෙලට නිදසුන් ලෙස පෙන්වාදිය හැක.

රජය විසින් භාෂා අයිතිය පුළුල් කිරීම සඳහා ගෙනයන වැඩපිළිවෙල පිළිබඳ ප්‍රායෝගික අවබෝධයක් ජනතාව වෙත ලබාදීමත්, ඒ පිළිබඳව ජනතාව දැනුවත් කිරීමත් භාෂා අයිතිය කෙරෙහි ජනතා මැදිහත්වීම සාර්ථකවීමට හේතු වේ. අපගේ ව්‍යාපෘතියට සහභාගි වූ ජනතාව ඔවුන් සිටි ප්‍රදේශවල ක්‍රියාත්මක වූ යුක්තිය, ප්‍රතිසංස්කරණ සහ මගපෙන්වීම්වලට සාපේක්ෂව තම භාෂා අයිතිවාසිකමෙහි මානයන් හා සීමාවන් පිළිබඳව වඩා වැඩි අවබෝධයකින් හා දැනුමකින් යුක්ත වූහ. නිදසුනක් ලෙස, පුත්තලම ප්‍රදේශයෙන් සහභාගි වූවන් විසින් රාජ්‍ය සේවය තුළ භාෂාමය සමානාත්මතාව ගොඩනැංවීම සඳහා විවිධ පියවර ගෙන එන ලදී.
භාෂා ත්‍රිත්වය ඔස්සේ ම
ක්‍රියාත්මක නොවන රජයේ ආයතන හඳුනාගැනීම; දිස්ත්‍රක්ක් මට්ටමේ සමාජ කටයුතු සම්බන්ධීකරණ හමුදා නිලධාරියා වෙත මෙම කරුණු දක්වා සිටීම;





ඊට සමගාමීව ජාතික භාෂා කොමිසම වෙත මේ තත්ත්වයන් දැනුම්දීම; 1956 විශේෂ දුරකථන අංකය අමතා ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධ කිරීමේ අමාත්‍යාංශය වෙත දැනුම්දීම; ජාතික භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ රජයේ නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පවත්වන ලෙස අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටීම; ප්‍රජා සංවිධාන මට්ටමෙන් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය හා මෙහෙයවීම සිදුකිරීම වැනි පියවර ඒ යටතට ගත හැකිය.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සංක්‍රාන්තික යුක්ති වැඩපිළිවෙල සාර්ථක කරගැනීම සඳහා බිම් මට්ටමේ ජනතාව තම භාෂා අයිතිය වෙනුවෙන් බලගැන්වීමේ ක්‍රියාවලියට භේදයකින් තොරව සෑම භාෂා කණ්ඩායමකට ම අයත් ජනතාවගේ පුළුල් සහභාගිත්වයක් සහ සහයෝගයක් අපගේ ව්‍යාපෘතියට ලැබුණි. රජය විසින් අරඹන ලද අධ්‍යාපනික වැඩසටහන සහ ජාතික දැනුවත් කිරීමේ දේශන ද, ජනතාවට ප්‍රවේශවීමේ හැකියාව ඇති ආයතනික පද්ධතියක් ස්ථාපනය කිරීම තුළින් සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය තවදුරටත් විචිත්‍රවත් වනවා මෙන්ම වෙන්ව සිටි ප්‍රජාව එකතුවීම සඳහා දැනුවත් ප්‍රජා සහභාගිත්වයක් ද අපේක්ෂා කළ හැක.

**ප්‍රජාතන්ත්‍රවාදය සඳහා කාන්තාවන්ගේ සහභාගිත්වය**

"කාන්තාවන් දේශපාලනය සඳහා යොමුවන්නේ නැත්තේ එය පුරුෂ මූලික දෙයක් විදිහට අපි දකින නිසයි."
- ගාල්ල ප්‍රදේශයේ මුස්ලිම් කාන්තාවක් -

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයේ සාර්ථකත්වය සියලු වැසියන්ගේ නිදහස් සහ ක්‍රියාශීලී සහභාගිත්වය මත රඳා පවතී. කෙසේ වුවද, ලාංකීය දේශපාලනය තුළ කාන්තාවන්ට හිමිව ඇත්තේ සුළු ඉඩකඩකි. ලෝකයේ ප්‍රථම අගමැතිනිය තේරී පත්කර ගනිමින් ලංකාව,
කාන්තාවන්ට දේශපාලන මෙන්ම සමාජයීය තලයේ ඉහළ වටිනාකමක් ලබාදෙන බව ලොවට ම පෙන්වා දුන්නද, දශක අටක පමණ ලාංකීය දේශපාලනය තුළ කාන්තාවන්ගේ පාර්ලිමේන්තු නියෝජනය 5.8% නොඉක්මවීම කනගාටුවට කරුණකි. මෙම තත්ත්වය ඊට පහළ පාලන ආයතනයන් හි මීටත් අවම මට්ටමක පවතී. පළාත් සභාවල කාන්තා නියෝජනය (4.1%)ක් සහ
ප්‍රාදේශීය සභාවල එම අගය (2.03%) ක් දක්වා අඩුවීමෙන් ඒ බව තහවුරු වේ. අන්තර් පාර්ලිමේන්තු සැසිය විසින් පවත්වන ලද පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය පිළිබඳ කරන ලද සමීක්ෂණයට අනුව පැවති රටවල් 139න්



ලංකාව 130 වන ස්ථානය ලබාගෙන ඇත ; ගෝලීය සමාජයීය ආයතන සහ ස්ත්‍රී පුරුෂ දර්ශකයන්ට අනුව කාන්තාවන් නොසලකා හැරීමට ලක්වන අන්දමේ නීති හා අණපනත් පනවන රටවල් අතරින් ඉහළ ස්ථානයක සිටින බවත්,
කාන්තාවන්ට ඇති සමාජයීය ආරක්ෂණය පහළ මට්ටමේ පවතින බවත්, කාන්තාවන්ට පවතින අවස්ථාවන් සහ සම්පත් සීමාකිරීම්වලට සහ බාධා කිරීම්වලට ලක්කිරීම අතිනුත්, කාන්තා
නායකත්වය සහ සමාජය තුළ ප්‍රසිද්ධියට පත්වීම පිළිබඳව පවතින සමාජයීය සෘණාත්මක ආකල්පයන් සහ, කාන්තාවන්ගේ සිවිල් නිදහස සීමා කිරීමත් ලෝකයේ විවේචනයට බඳුන් වී ඇත. ඇත්ත වශයෙන් ම දේශපාලනය සඳහා කාන්තා සහභාගිත්වය රටේ පවතින අනෙකුත් සමාජ ගැටලු සමඟ බද්ධ වී පවතී. විශේෂයෙන් ම, දිළිඳුබව, ලිංගිකත්වය මුල්කොටගත් වධ හිංසනයන්, කායික හා මානසික සෞඛ්‍යය, උසස් අධ්‍යාපනය, ආර්ථික දායකත්වය, තම ප්‍රජාව වෙතින් සිදුවෙන වාර්ගික වෙනස්කම් ආදිය පශ්චාත් යුද වාතාවරණයක් තුළ ප්‍රතිසාධනය කරා යන ගමනේ දී කාන්තා





කිරීමෙන් වෙනසක් ඇතිකිරීම සඳහාත් හැකි නායකත්වයක් ලබාදියහැකි කාන්තා මැතිවරණ අපේක්ෂකයින් හිඟකමයි .
ලිංගික හිංසනය,ළමා අපචාර,කාන්තා-වන්ට
ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් හිමි නොවීම,
වැන්දඹුවන්ට සිදුවන සමාජීය අපකීර්තිය,
ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනයට
පවතින අවහිරතා ආදී ගැටලු වෙනුවෙන් කටයුතු කිරීමට පවතින දේශපාලන සන්දර්භය තුල නිසි කාන්තා නායකත්වයක් නොමැතිවීම ගැටලුකාරීය.
සුහද සංචාරයන් අතරතුර දී පොදු අවකාශයන් තුන කාන්තා නායකත්වය පිළිබද සමාජීය ආකල්පය කාන්තාවන් දේශපාලනයට යොමුකිරීමට කොතෙක්දුරට ගැලපෙන්නේද යන්න පිලිබඳව අපි විසින් කාන්තාවන් සම්බන්ධ කරගනිමින් ආදර්ශ විවාදයක් සංවිධානය කළහ. එහිදී හඳුනාගත් ප්‍රමුඛ කරුණක් වුයේ තම පවුල්වල කාර්යයන් සම්බන්ධයෙන් කාන්තාවන්ට පවතින ප්‍රමුඛ වගකීම මෙම දේශපාලනික සහ නායකත්ව සඳහා බාධාවක් ව පවතින බවයි. ඔවුන් පැවසු ආකාරයට ගෙදර-දොරේ කටයුතු නිසි ලෙස ඉටු නොකිරීමෙන් දරුවන් රැකබලා නොගැනීමෙන් කාන්තාවන් පාර්ලිමේන්තු යාමෙන් එලක් වේද යන්නයිග කාන්තාවන් දේශපාලනයේ නියැලුනහොත් ඔවුන්ගේ සැමියන් දරුවන් රැකබලාගන්නේ කවුරුන්ද ,එලෙසින්ම කාන්තාවට දේශපාලනයේ නිරතවීමට තරම් දැනුමක් හෝ අත්දැකීම් හෝ වගකීම් සහිත වගකීම් සහිත නායකත්වයක් දැරීමේ හැකියාව ඔවුන්ට නොමැතිකමද ඔවුහු නවත නැවතත් කියා සිටියහ.
”ඔවුනට් රාත්‍රියේ ප්‍රශ්නයක් සඳහා එළියට යාමට සිදුවුනහොත් ඔවුන්ට සිදුවන්නේ අපකීර්තිමත් චරිතයක් ලෙස සමාජයෙන් හංවඩු ගැසීමයි.
එසේම, ඔවුන් පැහැදිළි කළ අන්දමට අපේක්ෂකයින් ලෙස ඉදිරිපත්වීමට ඔවුන්ට ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් හෝ ශක්තිමත් සමාජ

අයිතිවාසිකම් මතින් දේශපාලනයට පිවිසීම කෙරෙහි බලපාන සමාජ සාධකයන් ලෙස හඳුනාගත හැක.

මෙම සීමාකිරීම් මධ්‍යයෙහි දේශපාලනය සඳහා කාන්තා සහභාගිත්වය විමසා බැලූ කළ ව්‍යාපෘතියට සහභාගි වූ බොහෝ කාන්තාවන් ප්‍රකාශකර සිටියේ තමන්ගේ ඡන්ද අයිතිය පිළිබඳවයි. පවතින පාලන තන්ත්‍රය වෙනස් කිරීමට සහ ජාතියට බලපෑම් සහගත වෙනසක් සිදුකිරීම සඳහා තමාට හිමිව ඇති වැදගත් අවස්ථාවක් ලෙස කාන්තාවෝ ඡන්ද අයිතිය සැලකූහ.

"හැම දේකටම තියෙන සීමාවන් ඇතිවෙලා කියලා හිතෙන වෙලාවක් හැමෝටම එනවා. අපි ඒ විදිහටයි අතීතයේ ජීවත් වුණේ. ඒ වගේ තත්ත්වයක දී තමයි අපි රටේ වෙනසක් සඳහා අපේ ඡන්ද අයිතිය භාවිත කරන්න පෙළඹුණේ. අපේ ඡන්දය නිසා රටට නිවැරදි නායකත්වයක් ලැබීම ගැන අපි ආඩම්බර වෙනවා. එය අපිව පොදු සමාජයීය සහභාගිත්වය සඳහා දිරිගන්වනවා."
- පුත්තලමේ දමිළ කාන්තාවක් -

එම ප්‍රජාව අතර සිටි පිරිමින් ද මෙම අදහස ම දෙමින්,
"වෙන අවුරුදුවල වගේ නෙමෙයි හැම කාන්තාවක් ම මේ ජනවාරියේ දී ඡන්දය භාවිත කළා. මේ නිසා අපේ කාන්තාවනුත් නවමු වෙනසක් සඳහා දායක වූ බව අපි විශ්වාස කරනවා."
- පුත්තලමේ මුස්ලිම් වැසියෙක් -

ඡන්දය දැමීම පිළිබඳව කාන්තාවන්ට දැනුම ලබාදීම යටතේ ඡන්ද
ක්‍රමයේ ස්වභාවය, යෝජිත
අපේක්ෂකයින් පිළිබඳව සැමියන්ගේ හා කුලයේ හේතූන් මත කාන්තාවන්ට විවෘත නොවූ ඡන්ද ප්‍රතිපත්තීන් පිළිබඳ අධ්‍යාපනය ලබාදීමේ වැදගත්කම අවධාරණය කළහ. තවත් කරුණක් වන්නේ, තමන්ගේ එදිනෙදා අභියෝගයන් හඳුනාගනිමින් කාන්තාව සඳහා පවතින සාමාජීය ඉඩකඩ පුළුල්



ජාලයක පැවැත්මක් හෝ නොපවතින බවයි. එමෙන්ම ලාංකීය දේශපාලනයේ පවතින ප්‍රචණ්ඩත්වයන්, විනිශ්චිතභාවයන් මෙන්ම කාන්තාවන්ට සිදුවියහැකි අපයෝජනයන්,වැරදි භාවිතයන්ට මෙන්ම හිරිහැරයන්ට ලක්වීමට සිදුවීම පිළිබඳ බියකින් ඔව්හු පෙළෙණහ.
කාන්තාවන්ගේ දේශපාලනික මැදිහත්වීම් පිලිබඳව සමාජය දරන ආකල්පයන් ආදර්ශ විවාදයේදී කතිකාවට බඳුන් විය.ඒ අනුව තමන්ට රැජිනක් වීමට අවශ්‍ය නම් දරුවා රජෙකු කරන්න යන සාමාජිය ආකල්ප මත මවක් ලෙස තම දරුවන්ගේ හා සැමියන්ගේ කාර්යයන්ට උපකාර වෙමින් දේශපාලනය පිළිබඳ අවධානය යොමුකිරිම තුළින් ඔවුන් යහපත් පුරවැසියන් බවට පත්කළ හැක තම වගකීම් හා යුතුකම් අතපසු කරමින් සමාජ කාර්යන් සඳහා කාන්තාවන් බැහැරව යාම තුලින් පවුල් සංස්ථාව බිඳවැටීමට ඉඩ ඇතග
"ඔවුන් සාරි ඇඳගෙන දේශපාලනයට ගොස් ජීන්ස් කලිසම් ඇඳන් ආපසු එනවා "(කාන්තා නායකත්වය බටහිරකරණයට ලක්වීම පිළිබඳ පවතින විවේචනාත්මක අවබෝධය)නල දරුවන් සැදීමට සිදුවීම (පිරිමින් සතු කාර්යන් දැරීම තුළ කාන්තාවන් නිසරු බවට පත්වීමට හැක යන අදහස) අවසානයේ ඔවුන්ගේ සැමියන් තම අවශ්‍යතාවයන් ඉටුකරගැනීමට වෙනත් කාන්තාවන් වෙත යාමට පෙළඹීම සිදුවිය හැක. කාන්තාවන්ට දේශපාලනය සුදුසු බවට පක්ෂව කතාකරන පිරිස තර්ක කරන්නේ කාන්තාවන් තම සැමියන්ගේ කටයුතු කිරීම පමණක් ප්‍රමාණවත් නොමැති බවයි.කෙසේ වුවද මෙම පක්ෂයට පැවති තර්ක හා කරුණු ඉතා සීමිත මට්ටමක පැවතීම හා ඒවා ස්ත්‍රීවාදී අදහස්වලින් යුක්ත සමාජීය ආකල්ප විවේචනයට බඳුන් කරන ශක්තිමත් තර්කයන්ගෙන් තොර ඒවා විය.
"මිනිසෙක් යම් කාර්යක් සඳහා මුල්වීම සාමානය දෙයක්.ඒත් ඔහු එය සාර්ථක කරගත්තොත් ඔහුව වීරයෙක් විදිහට සලකනවා.ඒ ඔහු පිරිමියෙක් වීම නිසා. ඒත් කාන්තාවක් ඒක කළොත් ඇය සමාජයේ හුදෙකලාවට මෙන්ම අපකීර්තියට පත්වන්නේ ඒක කාන්තාවකට සුදුසු දෙයක් නෙවෙයි කියන අදහස නිසා. ඒ වගේම පුරුෂාධිපත්‍ය බලය කාන්තාවන්ව නවත්වනවා. කාන්තාවන් අසාර්ථකත්වයට පත්වීමේදී මෙය බොහොම නරක විදිහට බලපානවා. ඇයව පිරිමින් අතර පමණක් නොව කාන්තාවන් අතරද විහිළුවක් බවට පත්වෙනවා."
සමාජයේ පවතින මෙම ආකල්ප මත කාන්තාවන් දේශපාලනයෙන් බැහැරව සිටියද ඔව්හු තම ප්‍රජාව වෙනුවෙන් නවමු වෙනසක් කිරීම සඳහා දිරිමත් වෙති.
කාන්තාවන්ගේ සමාජීය ජීවිතය බොහෝවිට තම දරුවන් රැකබලාගැනීමේ පවුල් වගකීම් සමාජීය ජීවිතය ගතකිරීම ඔවුන්ව දේශපාලනික වශයෙන් නගාසිටුවීමට මූලික වේ. ඔවුන් සමාජීය ජීවිත ලෙස පොදු සමාජයට විවෘතවීමේදී ඔවුන්ව මවක් හා බිරිඳක් වැනි තත්ත්වයන් සහිතව නිරූපනය වේ. මෙම මතයන් බිඳ දමමින් කටයුතු කරන කාන්තාවන් අතර තම අතුරුදහන් වූ දරුවන් සොයා යන මවුවරුන් සහ කීර්තිමත් නායකයින්ගේ වැන්දඹු බිරියන් අපේක්ෂකයින් ලෙස තේරී පත්වීම හඳුනාගත හැකගකාන්තාවන්ගේ ප්‍රජා දායකත්වය මවක් වශයෙන් මෙන්ම සමාජීය වශයෙන්ද ශක්තිමත් වේ.නිදසුනක් ලෙස මන්නාරමේ මවුවරුන්ගේ සමිතියක් විසින් බිම්මට්ටමේ ජනතාවගේ සාමූහිකත්වයෙන් ළමා අපචාරයන් වැළක්වීමට හා කාන්තා අයිතීන් පිළිබඳ සාකච්ඡා කිරීමේ සංසදය පිහිටුවීම හඳුනාගත හැක. මෙය මුලින්ම ගම්මාන 5 කට හඳුන්වාදුන් අතර වර්තමානය වන විට දිස්ත්‍රික්කය පුරාම ව්‍යාප්ත වී ඇත.මෙම කාන්තාවන් අපගේ ව්‍යාපෘතිය සඳහා දායක වූ සම්පත් දායකයින් ලෙස දැක්විය හැකි අතර ඔව්හු තමන්ට බලපෑම අභියෝගයන් හට අර්ථාන්විත වෙනසක් සිදුකළවුන් ලෙස අගය කළ හැක.
''බලාපොරොත්තු සහිතව හෝ රහිතව අපේ කාන්තාවන්ට සමාජීය කටයුතුවල නිරතවීමේදී සම්ප්‍රදායික සංස්කෘතික හා සමාජීය බාධකයන් එල්ල වුණා"
මන්නාරමේ දෙමළ කාන්තාව කේස සංසදය වැනි ක්‍රියාකාරකම්වල සාර්ථකත්වය තවදුරටත් කාන්තා නායකත්ව හා වටිනාකම පෙන්වාදෙන අතර කාන්තාවන්ගේ දේශපාලනික ජීවිතය ශක්තිමත් කිරීමට බලපාන සමාජීය තල්ලුවක් ලෙස එය දැක්විය හැක.
කාන්තාවන්ගේ දේශපාලනික නිරතවීම් සඳහා කෙතරම් බාධක පැවතියත් මෙවැනි ප්‍රජාමූලික කර්තව්‍යන් ඔවුන්ව දේශපාලනික සහභාගිත්වය සඳහා ඔසොවා තැබීමට හේතු වේගකාන්තාවන්ගේ දේශපාලනික සහභාගිත්වය ඉහළයෑම සඳහා අවශ්‍ය කරුණු ගාල්ල ප්‍රදේශයේ කාන්තාවන් විසින් පහත පරිදි පෙළගස්වන ලදී.

**දේශපාලනය සඳහා කාන්තා නියෝජනය ඉහළ නැංවීමේ සැලසුම**
**ගාල්ල කණ්ඩායම**

1. කුඩා කණ්ඩායම් සංවිධානය කිරීම
2. කණ්ඩායම තුළ ආර්ථික ශක්තිය වර්ධනය කිරීම
3. කණ්ඩායමේ සාමාජිකයින් අතර විශ්ව-

ාසය වර්ධනය කිරීම

4. සමිති,සමුළු වැනි සංවිධාන ස්ථාපනය කිරීම හා ඔවුන්ට පුහුණුව ලබාදීම
5. රාජ්‍ය ආයතනවල සහයෝගය ඉල්ලා සිටීම
6. ආගමික අන්තර් සංස්කෘතික උත්සව සංවිධානය කිරීම
7. ඉහත ක්‍රියාකාරකම්වල නිරතවූ කාන්තාවන්ව ප්‍රාදේශීය හා ජාතික මට්ටමේ දේශපාලනයට යොමුකිරීම
8. කාන්තා නියෝජනය ප්‍රජාවගේ සිට දිස්ත්‍රික්ක හා ජාතික මට්ටමට පුළුල් කිරීම
9. කාන්තා කණ්ඩායම් සහ කාන්තා නියෝජිතයින් සමාජයේ විවිධ පුද්ගල කණ්ඩායම් සමඟ (ග්‍රාම නිලධාරින්, ආගමික නායකයින්, වෘත්තිකයින්, සිවිල් සමාජ සංවිධාන ආදිය) සමඟ මිශ්‍ර වී ප්‍රජා ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමරීම මෙම සැලසුම මඟින් පැහැදිලි වන්නේ අත්දැකීම් සහිත සහ සම්බන්ධතා සහිත කාන්තාවන්ගේ දායකත්වය මත ප්‍රජාමූලික උත්සාහයන් තුළින් කාන්තාවන්ට තම නායකත්වය වර්ධනයට සහය ලබාගත හැක.එය පෙන්වාදෙන අන්දමට මූල්‍යමය ස්ථාවරත්වය එකිනෙකා අතර විශ්වාසයත්, පුළුල් ඉඩකඩ ලබාදීම,සහ ආයතනික සහයෝගය වැනි මූලාශ්‍රයන් ඉතා වැදගත් අංශයන් වේ.කාන්තාවන් සඳහා පවතින සමාජීය බාධාවන් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයන් තුළ නොසලකාහැරීමට ලක්වේ.ඒ වෙනුවට කාන්තා ජාලයන් ශක්තිමත් කිරීම,අත්දැකීම් බෙදාගැනීම,දිරිගැන්වීම, දේශපාලනික ක්‍රියාකාරකම්වල නියැලීමට යොමුකිරීම වැනි ක්‍රියා තුරන් කාන්තාවන්ට තම නායකත්වය සහ දේශපාලනික අයිතීන් වර්ධනය කරගත හැක .

"කාන්තාවන් වන අප විවිධ අංශයන්හි දක්ෂයෝ වෙමු.අපට සමාජයේ පවතින ඕනෑම වගකීමක් දරන්න පුළුවන්."

**නිර්දේශයන්**

1. රාජ්‍ය සේවයට ප්‍රවේශවීමේ හැකියාව වර්ධනය කිරීම ප්‍රජාතන්ත්‍රවාදී සහ යහපාලන සමාජයක පුරවැසියන්ගේ අයිතිවාසිකම් සැමට සමානව හිමිවේ.වාර්ගිකත්වය,ආගම, ලිංගභේදය වැනි කාරණා මත වෙනස්කමකට බඳුන් නොකර රාජ්‍ය සේවය ලබාගැනීම සඳහා පුරවැසියන්ට ප්‍රවේශවීමට ඇති හැකියාව ජේෂ්ඨ නිලධාරින් විසින් නීතියේ ආධිපත්‍ය මත පිහිටා ජනතාවට සැපයිය යුතුය.

සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය හරහා අරමුණු ආයතනික වෙනස්කම් හා දිර්ඝකාලින ආයතනික ප්‍රතිසංස්කරණ වශයෙන් සිදුකිරීම අත්‍යවශ්‍ය වේ. ඥාති සංග්‍රහය,හා දූෂණ ක්‍රියාවලින් රාජ්‍ය සේවය ලබාගැනීමට එරෙහිව පවතින බාධාවන් ලෙස හඳුනාගත හැක. කුසලතාවය මත බඳවාගැනීම් සිදුකිරීම,ආයතනික හා පුද්ගල විනිවිද බව සඳහා දිරිගැන්වීම,සහ වංචා හා දූෂණයන් සිදුකරන්නන්ට විරුද්ධව දැඩි ක්‍රියාමාර්ග ගැනීම වැනි ක්‍රියාමාර්ග ගැනීම කළ යුතුය.සමාජයේ සිදුවන කොන්වීම් අවම කිරීම සඳහා මුල්වන භාෂා අයිතිය බලාත්මක කිරීමට ක්‍රියා කළ යුතුය. ස්ලාම් බැතිමතුන්ට ආගම ඇදහීම සඳහා කාර්යාල තුළ ඉඩකඩ සපයාදීම,තම ආගම සහ සංස්කෘතිය මත පදනම් වූ ඇඳුම් පැළඳීමට නිදහස ලබාදීම ආදිය ජාතියේ ප්‍රවර්ධනයට හේතු වේ.

කාන්තා කටයුතු සඳහා කාන්තා සේවක පිරිස් බඳවාගැනීම පුළුල් කිරීම මඟින් කාන්තා පොලිස්නිලධාරිනියන්, නීති උපදේශකවරියන්, කාන්තා සංවර්ධන නිලධාරීන් ලිංගිකත්වය මත පදනම් ව ක්‍රියාත්මක වන බාධකයන් සඳහා සංවේදී රාජ්‍ය සේවයක් වර්ධනය කරගත හැකිවීම. නීතිය, ආර්ථික සංවර්ධනය, සෞඛ්‍ය සේවය යන ක්ෂේත්‍ර සඳහා කාන්තා නිලධාරී සේවය ඉහළ දැමීම තුළින් කාන්තාවන් සඳහා සමාජ සුරක්ෂිතතාව වර්ධනයවීමටත් ඔවුන්ගේ අයිතීන් වෙත ප්‍රවේශවීමටත් වැඩි හැකියාවක් ලැබේ. ලේඛනගත කිරීම මේ සඳහා බලපාන තවත් ගැටලුවකි. විශේෂයෙන් ම වැවිලි අංශයේ සිදුවන ලේඛනගතවීමකින් තොර ජනගහන වර්ධනය පුරවැසිභාවය පිළිබඳ ප්‍රශ්න මතුකරන අතර, යුද්ධය පැවති ප්‍රදේශවලලේඛනයන් විනාශවීමහා අතුරුදන්වීම ද පුරවැසිභාවය පිළිබඳව ඇති සහතික කරවීමට බාධා පමුණුවයි. පුරවැසියන්ගේ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් සුරක්ෂිත කිරීමට කළ යුතු පළමුවැන්න වන්නේ උප්පැන්න සහතිකයේ සිට ජාතික හැඳුනුම්පත දක්වා ම ඔවුන්ට පුරවැසියන් ලෙස සමාජය තුළ සහතිකවීමට අවශ්‍ය ලේඛන සපයාදීමයි.

2. **මහජන යෙදවුම් සහ තොරතුරු** සහභාගිත්වය හා තොරතුරු දැනගැනීම මත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමය රඳා පවතී.රජය විසින් එකතු කරන ලද විශේෂ ප්‍රතිපත්ති හා නියාමකයන් පිළිබඳවත් ආයතනික ක්‍රියාවලීවලින් පිළිබඳ තොරතුරුත් අඩංගු තොරතුරු සංවර්ධනය කිරීම ඉතාමත් හදිසි අවශ්‍යතාවයකි.එය ජනතාවට ප්‍රවේශවීමට පහසු හා පැහැදිලි තත්ත්වයකින් යුක්ත විය යුතුය.මෙම ක්‍රියාවලිය සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය සඳහාද වැදගත් වන නමුත් එහි පවතින නුහුරුභාවයත් විවේචනාත්මක පැතිකඩයන් ජනතාව තුළ ව්‍යාකූලතකුලත්වයක් ඇති කිරීමට සමත්ව ඇත. ජාතික තීරණ ගැනීම සඳහා ජනතා සහභාගිත්වයන්,ජනතා ප්‍රවේශය සඳහා

රාජ්‍ය අංශයන් හි රාමුගත කාර්ය පටිපාටියත්, බිම්මට්ටමේ ප්‍රජා අධ්‍යාපනික ව්‍යාපාරත් ජනතාව දැනුවත් කරගැනීමකින් යුතුව මෙම ක්‍රියාවලියට දායකවීමට හේතු වේ.ජනතා දැනුවත්කිරිමකින් හෝ සහභාගිත්වයකින් තොරව ජාතික තීරණ ගැනීම හේතුවෙන් ජාතිවාදී සහ කලහකාරී කණ්ඩායම් විසින් ගැටලු මතුකළ අවස්ථාවන් ලංකාවේ අතීතය විමසීමේ දී සිහිකර දේ. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය සඳහා සංස්කෘතිකමය වශයෙන් ලද දෙයින් සතුටුවීම වෙනුවට තීරණයන් ගැනීම සඳහා මැදිහත්වීමත් සාමය හා ප්‍රතිසංස්කරණයන් සඳහා ඔවුන්ගේ දැනුම වර්ධනය සඳහා සම්පත් ආයෝජනය කිරීමත් අවැසිය.

### 3. සමාජීය ව්‍යවසායන් සඳහා කාන්තා නායකත්වයන්ට සහය දීම

බිම්මට්ටමේ සිටින කාන්තාවන්ගේ සමාජීය ජීවිතයන් ඔවුන්ගේ හැකියා වර්ධනය කිරීමත්,අත්දැකීම් හා සමාජ ජාලයන් ඔස්සේ ප්‍රජා නායකත්වය සඳහා අවශ්‍ය අවකාශය උදාකරදීම තවත් වැදගත් යෝජනාවක් ලෙස දැක්විය හැක. එමෙන්ම පශ්චාත් ගැටුම් ප්‍රතිසාධන ක්‍රියාවලිය තුනෙන් කාන්තා හා ළමා සුභසාධනය, වැන්දඹුවන්ගේ ජීවනතත්ත්වය වැනි රාජ්‍ය සේවය විසින් සුදුසු පියවර ගැනීමට අපොහොසත්වූ කරුණු සම්බන්ධයෙන් ඇතිවී ඇති හිදැස් පුරවයි.රජයේ සහ සිවිල් සමාජයේ සහයෝගය ඉහළ දමාගැනීම මගින් ප්‍රජාමූලික කාන්තා කණ්ඩායම්වලට කාන්තාවන්ගේ සමාජ ආකර්ශනය වර්ධනය කරගැනීමටත් කාන්තා අයිතීන් බලාත්මක කරගැනීමටත් දේශපාලන නායකත්වය සඳහා කාන්තා සහභාගිත්වය වර්ධනයටත් හැකියාව ලැබේ.කාන්තා නායකත්වය යටතේ සිදුකරන ප්‍රජා වැඩසටහන් සඳහා ආධාර ලබාදීමත්, කුසලතා වර්ධනය සඳහා ඉඩ ලබාදීමත්,ප්‍රාදේශීය පාලන ආයතන හා කාන්තා කණ්ඩායම් අතර සම්බන්ධතා ශක්තිමත් කිරීම, කාන්තා කණ්ඩායම් හා රටේ විවිධ ප්‍රදේශවල වෙසෙන්නන් අතර පවතින සම්බන්ධතාව ශක්තිමත් කිරීමත් කාන්තා කණ්ඩායම්වලට උපදෙස් ලබාදීමත් තීරණ ගැනීම සහ වැඩසටහන් සැලසුම් කිරීමේදී කාන්තාවන් දායක කරගැනීම මගින් සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය තුළ ඔවුන්ගේ භූමිකාවන් අර්ථාන්විත කිරීමට හැකිවේ.අවහිරතා මධ්‍යයේ වුවද

බිම්මට්ටමේ කාන්තාවන් විසින් අත්‍යවශය සේවාවන් ලබාදීමේ වැඩසටහන් සංවිධානයත්, ඔවුන්ගේ ප්‍රජාවේ දියුණුවත් ප්‍රතිසංධානය සඳහා සහය වීමත් සිදුකරන ලදී.රටෙහි සංවර්ධනයට සහ ප්‍රතිසාධන කාර්යය සඳහා කාන්තා නායකත්වයෙහි සහය ලබාගැනීමට යොමුවීම තුළින් සාමූහික වශයෙන් කාන්තාවන් ප්‍රබල සම්පතක් වන බව පැහැදිලිවේ.

### 4. කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය සඳහා සහය ලබාදීම

හිතකර ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා කාන්තාවන්ගේ දේශපාලනික සහභාගිත්වය අනිවාර්ය වේ. කෙසේ වුවත්, ලංකාවේ කාන්තා දේශපාලනික සහභාගිත්වය හා සමාජ ජීවිතය අතර විශාල පරතරයක් දැකගත හැකිය. 25%ක් වූ කාන්තා ප්‍රතිශතයක් මෙම වර්ෂය ආරම්භයේ දී ම විශාල ප්‍රාදේශීය මට්ටමේ ආරම්භයක් ස්ථාපිත කරන ලදී. ඒ සමාන ම වූ කාන්තා ප්‍රතිශතයකට පාර්ලිමේන්තුව වෙත තේරීපත්වීමට ඉඩදීම හරහා ජාතික මට්ටමේ තීරණ ගැනීම හා ප්‍රතිපත්ති නිර්මාණය සඳහා කමටවීමට අවස්ථාව හිමි වේ. අධ්‍යයනයන් පෙන්වා දෙන පරිදි කාන්තා නියෝජනය වැඩිකිරීම තුළින් එහි ප්‍රතිලාභ සියලු පුරවැසියන්ට හිමිවන අතර, ආර්ථික සංවර්ධනය, අධ්‍යාපනය, යටිතල පහසුකම් සහ සෞඛ්‍යය යනාදිය රජය කෙරෙහි ඇති විශ්වාසයන් ඉහළ යාම අපේක්ෂා කළ හැකිය. කාන්තා නායකත්වය වර්ධනයවීම පශ්චාත් යුධ ප්‍රතිසාධන ක්‍රියාවලියේ ජාතික අරමුණු හා සමපාත වනවා මෙන්ම ඒවා සංක්‍රාන්තික සමය සඳහා බලපෑමක් ඇති කළ හැකි උපායමාර්ගයක් ද වේ. කාන්තාවන්ට දේශපාලනයෙහි නිරතවීමට ඇති හැකියාව ක්‍රමානුකූලව වර්ධනය කළ යුතු ය. කාන්තා දේශපාලන ව්‍යාපාරය සඳහා අවශ්‍ය මූල්‍යමය බාධාවන් සඳහා පිළියම් සෙවීමත්, පුරුෂ මූලික සංස්කෘතික සමාජයන් ආමන්ත්‍රණය කිරීමට අව්‍ය සහයත් කාන්තාවන්ට ලබාදීමත්, ඔවුන්ගේ හැකියාවන් උපායශීලී ලෙස වර්ධනය කිරීමත්, මහජන සාකච්ඡා හා විවාද පැවැත්වීමත්, ඔවුන්ගේ මහජන හා සමාජ සම්බන්ධතා වර්ධනයත්, සුදුසුකම් සහිත කාන්තාවන් වෙනුවට දේශපාලන පක්ෂ සුදුසුකම් රහිත පිරිමි අපේක්ෂකයින්ගේ නාමයෝජනා ලැයිස්තුවට ඇතුළත් කරන්නේ දැයි වගබැලීම වැනි ක්‍රියාමාර්ගත් ඒ සඳහා ගත යුතු වේ.

"දහනමවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙනසක් සඳහා ඇති හොඳ ම නිදසුනයි. එයට 25%ක පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජිත මනාප හිමි වුණා. කොහොම වුණත් මේ සංඛ්‍යාත්මක

අගයයන් ඵල රහිත වෙනවා අපේ කාන්තා නි-යෝජිතයන් අපේ ප්‍රශ්න වෙනුවෙන් කතා කළේ නැති නම්. ඒ නිසා අපේ අදහස වන්නේ මෙ-වැනි තනතුරු සඳහා පත්වෙන අය අපේ ප්‍රශ්න ගැන හොඳ අවබෝධයකින් සිටිය යුතු බවයි."
- සිංහල කාන්තාවක් -

දේශපාලනය සඳහා කාන්තාවන්ගේ ගැලප-ම පිළිබඳ ව්‍යාජ කතිකාවත පෙන්වා දෙනුයේ, ලිංගභේදය පදනම් කරගත් සමාජ - සංස්කෘත-මය ආකල්පයන් කාන්තාවන්ගේ දේශපාලනික සහභාගිත්වයට බාධාවන බව සහ ඔවුන්ව නිවස තුළට සීමාකර ඔවුන්ගේ නායකත්ව හැකියාවන් ප්‍රතිශේධනය කිරීමට ලක්කරන බවයි. පවුලේ පිරිමි සාමාජිකයෝ, ප්‍රජාව හා දැනට දේශපාලන-යේ නිරත පිරිමි, ඔවුන්ට හැකි පමණින් කාන්තා-වන්ගේ දේශපාලන ජීවිතය සීමාකිරීමට තැත් කරති. පීඩාකාරී විශ්වාසයන්ට අනුව, කාන්තා-වන් අතර සංවේදීකරණය හා ආත්ම විශ්වාසය ගොඩනැගීම අවශ්‍ය වේ. අපගේ ව්‍යාපෘතිය දක්වන ආකාරයට දැනට දේශපාලන නායකත්-වයේ සිටින කාන්තාවන් මෙම කාර්යය සඳහා ඵලදායී ම මූලාශ්‍රයයි. දිළිඳුභාවය, වැන්දඹුභා-වය, වෙනස්කොට සැලකීම පිළිබඳ වූ සමාන අත්දැකීම්, සංස්කෘතික නියාමනයන් පිළිබඳ සමාන අවබෝධය, සමාන සිතුවිලි හා ප්‍රමුඛතාව-න්

පැවතීම හේතුවෙන් මෙරට දේශපාලනයේ නියුතු කාන්තාවන්, කාන්තා ප්‍රජාවේ නායකත්වය ශක්තිමත් කිරීම සඳහා වටිනා වත්කමක් වේ. එවැනි වූ නිපුණත්වයක් ලබාගැනීමට කාන්තා-වන්ට ඇති විභව ශක්තිය හා විශ්වාසය වර්ධනය කිරීම, පීඩාකාරී විශ්වාසයන්ට සංවේදී ලෙස අභියෝග කිරීම, ප්‍රායෝගික උපදෙස් ලබාදීම සහ තම

ලැදියාවන් ළඟාකර ගැනීම සඳහා කාන්තාවන්ට මඟපෙන්වීම සහ ඔවුන්ගේ නායකත්ව ශක්‍යතා වැඩිදියුණු කිරීම සඳහා අනන්‍ය වූ නිදසුනක් මොවුන් සපයයි.

ප්‍රතිසංවිධානය සඳහා සහයවීමත් සිදුකරන ලදී. රටෙහි සංවර්ධනය සහ ප්‍රතිසාධන කාර්යය සඳහා කාන්තා නායකත්වයෙහි සහය ලබාගැනීමට යෙ-ාමුවීම තුළින් සාමුහික වශයෙන් කාන්තාවන් ප්‍රබල සම්පතක් වන බව පැහැදිලි වේ.

"ජීවිතය ගලන ගඟක් වැනි ය. ඒ ගඟ මත බෝට්ටුවකි. ඔබට එම බෝට්ටුව ගිලෙන්නට නොදී පැදගෙන යාමට සිදුවේ. කාන්තාවන් බොහෝ ශක්තිමත් වන අතර, ජාතික සංවර්ධනයට දායකවීමේ හැකියාවෙන් යුතු ය. යමක් කිරීමට යමෙකු හට කැමැත්තක්, අභිප්‍රේරණයක් සහ ඉලක්කයක් පැවතිය යුතු ය. ඔබේ අදහස් ලබාදීම වඩා වැදගත් වේ. අප සියලුදෙනාට ගැටලු පවතී. ඔබ මෙන්ම මම ද හමුදා සෙබලුන්ගේ භාර්යාවෝ වෙමු. මම ජීවිතය නමැති දිය පහර තුළින් ගමන් කළෙමි. දැන් මම දේශපාලනයේ නිරතවන අතර, පළාත් සභාවේ සේවය කරමි. කාන්තාවන් හට නායකත්වයක් ලබාදිය යුතු ය. අපේ ගෘහස්ථ ජීවිතය මැතිවරණයක් වැනි ය. කාන්තාව නිරන්තරයෙන් පාලනයට යටත් වේ. එබැවින් ස්වාමියා නොමැතිව කටයුතු කරගැනීමේ හැකියාවක් ඔබ සතු විය යුතු ය.

දරුවා සමාජයට ඵලදායී පුරවැසියෙකු ලෙස ගොඩනැගිය යුතු ය. දෙමව්පියන්, දරුවන්ට නිසි අධ්‍යාපනයක් ලබා නොදෙන්නේ නම්, ඔවුන් සමාජය තුළ අසරණ වනු ඇත. මිනිසෙකු යුද්ධය අතරතුර නිවසට පැමිණෙන්නේ ද යුද මානසිකත්වයෙනි. එහිදී නිවස තුළ ද යුධ වාතා-වරණයක් ඇතිවීම නොවැළැක්විය හැකි ය. මෙම ගැටලු එකින් එක පිළිබඳව සාවධානව සිතා විසඳිය යුතු ය. රජයේ විශ්‍රාම වැටුප මත බලාපොරොත්තු නොතබා, ඔබ සුරක්ෂිත විය යුතු ය. ඔබ හඬ නැගිය යුතු ය. එය වඩා වැදගත් ය. අප මේ ගැටලු සියල්ලට මුහුණදෙමින් වුවද ඉදිරියට යා යුතු ය. සමාජය හා සබඳතා පැවැත්විය යුතු ය.

කාන්තාව අන් අයට නිදසුනක් විය යුතු ය. ඔබේ ගරුත්වය පවත්වාගෙන යා යුතු ය. අප මිය යාමට පෙර සමාජයට වැදගත් යමක් කළ යුතු ය. ඔබ, ඔබේ නිදහස සමඟ ශිෂ්ට ජීවිතයක් ගත කළ යුතු ය. යහපත් හා ශිෂ්ට දෑ කරමින් ඔබට ඔබේ ජීවිතය නිදහසේ ගතකළ හැකි ය. ඔබගේ ගැටලු පිළිබඳව පමණක් නොසිතා, අන් අයගේ ප්‍රශ්න පිළිබඳව ද අවධානය යොමු කළ යුතු ය. ඇතැම්විට අන් අයට සවන්දීමෙන් ද ඔබට ඔබේ ගැටලු විසඳාගත හැකි ය. ඔබ, ඔබේ ගැටලු ගැන සාකච්ඡා කිරීම හා ඒවාට මුහුණදීම මෙන්ම ඒවා විසඳාගැනීමට ඔබට ම බල කරගත යුතු ය. මෙම ගැටලු බොහොමයක් අපට පොදු ඒවා වන බැවින් එකට වාඩි වී සාකච්ඡාකර ඒවා විසඳා ගත හැකි ය. ඔබගේ නායකත්වය ඒ සඳහා වැදගත් වේ."

*- උපුලාංගනී මාලගමුව, උප-සභාපති, රණවිරු සෙවන අධිකාරිය -*

[4] Hunt, Swanee. Let Women Rule. Foreign Affairs, 2007.https://www.foreignaffairs.com/articles/2007-05-01/let-women-rule
Beaman, L., et.al. Women Politicians, Gender Bias, and Policy Making in Rural India.UNICEF. 2006: 11-16 http://www.unicef.org/french/sowc07/docs/beaman_duflo_pande_topalova.pdf

Briefing Paper No- 2, December 2016
Published by: National Peace Council- 12/14 Purana Vihara road, Colombo 6, Sri Lanka.
Tel:+94 112 818 344, 0112 854 127 Fax: +94 112 819 064
Web: www.peace-srilanka.org

All rights reserved. Material from this publication maybe used with due credit to the National Peace Council.
Thanking Ms. Mariyahl M. Hoole for drafting the Briefing Paper.

Supported by

FOKUS
FORUM FOR WOMEN AND DEVELOPMENT